සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2019 ජූලි

## (AA11) මූල්‍ය ගිණුම්කරණ මූලිකයන්

(Financial Accounting Basics)

2019-07-27
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද මාධ්‍යයෙන්,* ***එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ* ***නොහැකි*** *ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න පහළොව (15) කි.

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.8 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 ගිණුම්කරණයේ අරමුණක් වන්නේ:

(1) ව්‍යාපාරයේ ස්වභාවය අවබෝධ කර ගැනීමයි.

(2) නිෂ්පාදිතයක විකුණුම් මිල තීරණය කිරීමයි.

(3) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය අවබෝධ කර ගැනීමයි.

(4) අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා හඳුනා ගැනීමයි. (ලකුණු 02)

1.2 ණයට ගත් භාණ්ඩ සැපයුම්කරුවෙකුට ආපසු හරවා යැවීමේදී ගැනුම්කරු විසින් භාවිත කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලේඛනය (source document) වන්නේ:

(1) බැර පතයි. (2) විකුණුම් ඉන්වොයිසියයි.

(3) හර පතයි. (4) ගෙවීම් වවුචරයයි.

(ලකුණු 02)

1.3 "අස්තිත්වය විසුරුවා හැරීමේ තත්ත්වයට පත්වනතුරු එය දිගුකාලයක් පවතින බව උපකල්පනය කරයි."
ඉහත ප්‍රකාශයට අදාල ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) ඓතිහාසික පිරිවැය සංකල්පයයි. (2) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි.

(3) උපලබ්ධි සංකල්පයයි. (4) අස්තිත්ව සංකල්පයයි. (ලකුණු 02)

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක ලාභය ගණනය කිරීමට අදාල නිවැරදි සමීකරණය වන්නේ:

(1) අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + ගැනිලි + අතිරේක ප්‍රාග්ධනය.

(2) අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය.

(3) ආරම්භක ශුද්ධ වත්කම් - අවසාන ශුද්ධ වත්කම් - ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය.

(4) ආරම්භක ශුද්ධ වත්කම් + අවසාන ශුද්ධ වත්කම් - ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය. (ලකුණු 02)

1.5 අයිතිකරු විසින් ආයෝජනය කළ අමතර ප්‍රාග්ධනය හේතුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම තෝරන්න:

(1) වත්කම් අඩුවීම සහ ස්කන්ධය අඩුවීම. (2) වත්කම් වැඩිවීම සහ ස්කන්ධය අඩුවීම.

(3) වත්කම් වැඩිවීම සහ ස්කන්ධය වැඩිවීම. (4) වත්කම් අඩුවීම සහ ස්කන්ධය වැඩිවීම.

(ලකුණු 02)

1.6 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුලදී **ABC ට්‍රේඩර්ස්** විසින් පහත සඳහන් වියදම් දරා තිබේ:

| **විස්තරය** | **රු.** |
|---|---|
| ප්‍රදර්ශනාගාරයේ ඉදිකිරීමේ පිරිවැය | 525,000 |
| ප්‍රදර්ශනාගාරයේ සේවකයන්ට ගෙවූ වැටුප් | 63,000 |
| වායු සමීකරණයේ පිරිවැය | 92,000 |
| 2018/19 වර්ෂය සඳහා ප්‍රදර්ශනාගාරයේ රක්ෂණ වාරිකය | 28,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ABC ට්‍රේඩර්ස්** හි මුළු ප්‍රාග්ධන වියදම වන්නේ:

(1) රු.708,000/-. (2) රු.617,000/-. (3) රු.525,000/-. (4) රු.680,000/-.

(ලකුණු 02)

1.7 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන්, පරිගණකගත ගිණුම්කරණ පද්ධතියක ඇති ගනුදෙනු ගොනුවක් (transaction file) සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) එය මූලාශ්‍ර ලියවිලිවල අඩංගු දත්ත සාරාංශගත කරයි.

(2) එය කෙටි කාලයක් සඳහා පමණක් භාවිත කරයි.

(3) අවිනිශ්චිත ගිණුම, ගනුදෙනු ගොනුවක් සඳහා උදාහරණයකි.

(4) ඉහත සඳහන් සියල්ලම. (ලකුණු 02)

**1.8** සම්ප්‍රදායික ගිණුම් වර්ගීකරණය යටතේ, නාමමාත්‍ර (nominal) ගිණුමක් සඳහා උදාහරණයක් වන්නේ:

(1) ගොඩනැගිලි ගිණුමයි. (2) මෝටර් වාහන ගිණුමයි.

(3) බැංකු ණය ගිණුමයි. (4) විකුණුම් ගිණුමයි. (ලකුණු 02)

*අංක 1.9 සිට 1.15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.9** පොදු ජර්නලයේ සටහන් කරන ගනුදෙනු වර්ග තුනක්(03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

**1.10** පහත සඳහන් එක් එක් ප්‍රකාශය සඳහා අදාලවන නිවැරදි ගිණුම්කරණ සංකල්පය හඳුනා දක්වන්න:

(a) සමාගමක් විසින් තොග අගය කිරීම සඳහා භාවිත කරන ක්‍රමය ඒකාකාරීව අනුගමනය කළ යුතුයි.

(b) සෑම ගනුදෙනුවක්ම මුදලින් වාර්තා කරයි.

(c) අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික භාවිතය සඳහා ලබාගත් භාණ්ඩ ගැනිලි ලෙස සලකනු ලැබේ.(ලකුණු 03)

**1.11** ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවයන් (stakeholders) තිදෙනෙක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.12** 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සුපර් ට්‍රේඩර්ස්හි** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි:

| | රු. |
|---|---:|
| 2019 මාර්තු 31 දිනට මුළු වත්කම් | 950,000 |
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 400,000 |
| වර්ෂය සඳහා ලාභය | 150,000 |
| වර්ෂය තුළදී හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 100,000 |
| වර්ෂය තුළදී සිදුකල ගැනිලි | 75,000 |

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්, 2019 මාර්තු 31 දිනට මුළු වගකීම් ගණනය කරන්න. (ලකුණු 03)

**1.13** **සෑම් ට්‍රේඩර්ස්,** 2018 අප්‍රේල් 01 වන දින රු.750,000/- කට යන්ත්‍රයක් මිලට ගත් අතර, එය එදිනම සවි කරන ලදි. යන්ත්‍රය සවි කිරීමේ පිරිවැය රු.125,000/- කි. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ වර්ෂයකට 20% බැගින් සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂය ගණනය කරන්න. (ලකුණු 03)

**1.14** පොදු ගිණුම්කරණ මෘදුකාංග පැකේජ (general accounting software packages) සඳහා උදාහරණ තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.15** පොත් සාප්පුවක පහත සඳහන් එක් එක් ගනුදෙනුව සඳහා නිවැරදි ද්විත්ව සටහන සඳහන් කරන්න:

(a) මාර්තු මාසය සඳහා ගෙවිය යුතු විදුලිය රු.82,000/- කි.

(b) නැවත විකිණීම සඳහා රු.25,000/- ක ලිපිද්‍රව්‍ය ණයට මිලදී ගන්නා ලදි.

(c) ව්‍යාපාරයේ බැංකු ගිණුමට රු.12,000/- ක පොලී ආදායමක් ලැබුණි. (ලකුණු 06)

(මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**විජය,** රු.1,400,000/- ක් ආයෝජනය කරමින් හාඩ්වෙයාර් අයිතම විකිණීම සඳහා **විජය හාඩ්වෙයාර්** නමින් කේවලස්වාමි ව්‍යාපාරයක් 2018 අප්‍රේල් 01 දින ආරම්භ කළේය.

(1) 2018 අප්‍රේල් 01 දින සිදුකරන ලද ඔහුගේ ආරම්භක ආයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ:

| | **රු.** |
|---|---:|
| මෝටර් ලොරිය | 750,000 |
| මුදල් | 650,000 |
| **එකතුව** | **1,400,000** |

(2) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සිදුකළ මුදල් ගනුදෙනු පහත පරිදි විය:

| **මුදල් ලැබීම්** | **රු.** |
|---|---:|
| යෙදවූ මුදල් | 650,000 |
| අත්පිට (මුදලට) විකුණුම් | 2,500,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 1,300,000 |
| බැංකු ණය | 500,000 |
| | **4,950,000** |

| **මුදල් ගෙවීම්** | **රු.** |
|---|---:|
| වැටුප් සහ වේතන | 600,000 |
| විදුලිය | 68,000 |
| වෙළෙඳ ණයහිමියන්ට ගෙවීම් | 3,280,000 |
| ගැනිලි | 210,000 |
| | **4,158,000** |

(3) 2019 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

(4) 2019 මාර්තු 01 දින වාර්ෂිකව18% බැගින් වූ පොලී අනුපාතිකයක් යටතේ රු.500,000/- ක බැංකු ණයක් ලබාගත් අතර, එහි ප්‍රාග්ධන ආපසු ගෙවීම 2019 අප්‍රේල් 01 දින සිට කළ යුතුවේ.

(5) 2019 මාර්තු 31 දිනට පහත දැක්වෙන ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ ව්‍යාපාරයේ ගිණුම් පොත්වල තිබුණි.

| | **රු.** |
|---|---:|
| උපචිත විදුලිය | 18,000 |
| වෙළෙඳ ණයගැතියෝ | 275,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 225,000 |

(6) මෝටර් ලොරිය සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත වාර්ෂිකව 25% ක අනුපාතයට ක්ෂය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 මාර්තු 31 දිනට **විජය හාඩ්වෙයාර්** හි ශේෂ පිරික්සුම **පිළියෙළ කරන්න.** (ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

**සීමාසහිත KP සමාගම,** ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදකයෙකු වන අතර, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු **සීමාසහිත KP සමාගමේ** පොත්වලින් උපුටා ගන්නා ලදි:

| | **රු.** |
|---|---:|
| 2018 අප්‍රේල් 01 දිනට තොග: | |
| අමු ද්‍රව්‍ය | 1,200,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කල) | 885,000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 1,925,000 |
| සෘජු වේතන - නිෂ්පාදන කම්කරුවන් | 1,765,000 |
| කම්හල් යන්ත්‍ර නඩත්තු | 335,000 |
| ක්ෂය - ගොඩනැගිලි | 1,250,000 |
| ක්ෂය - කම්හල් යන්ත්‍ර | 1,100,000 |
| කම්හල් කළමනාකරුගේ වැටුප | 625,000 |
| විදුලිය | 750,000 |
| ජලය | 420,000 |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) අවසාන තොග පහත පරිදි අගය කර ඇත:

| | **2019 මාර්තු 31 දිනට (රු.)** |
|---|---:|
| අමුද්‍රව්‍ය | 1,100,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කල) | 975,000 |

(2) ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණයෙන් 80% ක් කම්හලට අයත් වේ.

(3) පහත සඳහන් වියදම්, පහත පරිදි බෙදා වෙන්කල යුතුය:

| **වියදම්** | **කම්හල** | **කාර්යාලය** |
|---|---:|---:|
| විදුලිය | 80% | 20% |
| ජලය | 70% | 30% |

(4) නිෂ්පාදිත භාණ්ඩ, පිරිවැය මත 10% ක ලාභාන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලැබේ.

**ඔබ විසින් කල යුතු දෑ:**

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත KP සමාගමේ** නිෂ්පාදන ගිණුම **පිළියෙල කරන්න**.

(ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**මවුන්ට් ස්ටීල් ට්‍රේඩර්ස්** හි ගණකාධිකාරීවරයා විසින් 2019 මාර්තු 31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම එකඟ නොවීය. වෙනස වූ රු.114,900/-, අවිනිශ්චිත ගිණුමට බැර කර, කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු.448,000/- ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කෙරුණි.

පහත දැක්වෙන වැරදි පසුව හඳුනාගන්නා ලදි:

(1) කාර්යාලයේ භාවිතය සඳහා රු.85,000/- කට මිලට ගත් පරිගණකයක්, පරිගණක නඩත්තු ගිණුමට හර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව සටහන් කර තිබුණි.

(2) රු.65,000/- ක අත්පිට විකුණුම්, රු.6,500/- ක් ලෙස විකුණුම් ගිණුමේ දක්වා ඇති අතර, එය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(3) ස්ථාවර තැන්පතුවක් මත ලැබුනු රු.28,200/- ක පොලී ආදායම, පොලී වියදම් ගිණුමට වැරදීමකින් හරකර තිබෙන අතර, එය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(4) රු.275,000/- ක ණයට ගැනුම්, වෙළෙඳ ණයහිමි ගිණුම සහ ගැනුම් ගිණුම යන දෙකෙහිම රු.257,000/- ක් ලෙස සටහන් කර තිබුණි.

(5) කාර්යාල උපකරණ මත ක්ෂය වූ රු.228,000/- , සම්පූර්ණයෙන්ම පොත්වලින් මගහැරී තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්. (ලකුණු 05)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 02)

(c) ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු ගලපන ලද ශුද්ධ ලාභය. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(A) කේවලස්වාමි ව්‍යාපාරයක් වන **සමන් ට්‍රේඩර්ස්හි** පොත්වලින් 2019 ජනවාරි මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටා ගන්නා ලදී:

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2019.01.02 | නැවත විකිණීම සඳහා රු.723,000/- ක් වටිනා භාණ්ඩ, ණයට මිලදී ගන්නා ලදී. |
| 2019.01.05 | අයිතිකරු වන **සමන්,** පිරිවැය රු.50,000/- ක් වූ භාණ්ඩ ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබාගන්නා ලදී. |
| 2019.01.10 | පිරිවැය රු.575,000/- ක භාණ්ඩ, රු.600,000/- කට ණයට විකුණන ලදී. |
| 2019.01.15 | ණයගැතියන්ගෙන් රු.550,000/- ක මුදලක් ලැබුණි. |
| 2019.01.28 | 2019 ජනවාරි මාසයේ දුරකතන බිල්පත රු.18,000/- ක් වූ අතර, රු.12,000/- ක් පමණක් ගෙවන ලදී. |
| 2019.01.30 | රු.500,000/- ක මෝටර් සයිකලයක් කාර්යාලයේ භාවිතය සඳහා අත්පිට මුදලට මිලදී ගන්නා ලදී. |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම **සටහන් කරන්න**.

[ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + ණයගැතියෝ + මුදල් = ස්කන්ධය (හිමිකම) + වගකීම්]

(ලකුණු 06)

(B) **අමල් ස්ටෝර්ස්** ලිපිද්‍රව්‍ය විකිණීමේ නිරත කේවලස්වාමි ව්‍යාපාරයකි. 2019 මාර්තු මාසය සඳහා **අමල් ස්ටෝර්ස්හි** ණයට විකුණුම් පහත පරිදි වේ:

| දිනය | ඉන්වොයිස් අංකය | ගනුදෙනුකරුගේ නම | අයිතම විස්තර | | | |
|---|---|---|---|---|---|---|
| | | | විස්තරය | ප්‍රමාණය | ඒකකයක මිල (රු.) | වෙළෙඳ වට්ටම |
| 2019.03.02 | 217 | **සීමාසහිත ABC සමාගම** | CR පොත් | 75 | 140 | 5% |
| 2019.03.10 | 218 | **කමල්** | පැන්සල් | 120 | 6 | - |
| 2019.03.25 | 219 | **පෙරේරා** | පෑන් | 180 | 8 | - |

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 මාර්තු මාසය සඳහා **අමල් ස්ටෝර්ස්** හි විකුණුම් ජර්නලය (දෛනික විකුණුම් පොත) **පිළියෙල කරන්න**.

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**MMK ට්‍රේඩර්ස්** යනු **මහීල්ට** අයත් තනි හිමිකාර ව්‍යාපාරයකි. 2019 මාර්තු 31 දිනට, **MMK ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**MMK ට්‍රේඩර්ස්**

**2019 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| **විස්තරය** | **හර** | **බැර** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැයට: | | |
| ඉඩම | 1,100 | |
| ගොඩනැගිලි | 3,200 | |
| කාර්යාල උපකරණ | 2,400 | |
| මෝටර් වාහන | 2,800 | |
| 2018 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිලි | | 1,200 |
| කාර්යාල උපකරණ | | 1,195 |
| මෝටර් වාහන | | 1,275 |
| ගැනිලි | 2,200 | |
| 2018 අප්‍රේල් 01 දිනට තොග | 1,100 | |
| විකුණුම් | | 16,300 |
| ගැනුම් | 7,950 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 4,320 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,120 |
| විදුලිය | 1,930 | |
| වැටුප් සහ වේතන | 1,800 | |
| කාර්යාල නඩත්තු වියදම් | 895 | |
| ප්‍රචාරණය | 430 | |
| 2018 අප්‍රේල් 01 දිනට අඩමාණ ණය සඳහා වෙන්කිරීම | | 220 |
| බැංකු අයිරාව | | 1,890 |
| ගෙවූ රක්ෂණ වාරිකය | 300 | |
| බැංකු අයිරා පොලිය | 375 | |
| 2018 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | | 5,600 |
| | **30,800** | **30,800** |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2019 මාර්තු 31 දිනට අවසාන තොගය, පිරිවැයට, රු.1,850,000/- කට අගය කරන ලදි.

(2) 2019 මාර්තු 31 දින, **මහීල්** විසින් රු.1,800,000/- ක් වටිනා ඔහුගේ පෞද්ගලික වෑන් රථය, ප්‍රවාහන කටයුතු සඳහා ව්‍යාපාරයට පවරන ලදි. මෙම ගනුදෙනුව ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

(3) පහත පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදනය කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | 10% |
| කාර්යාල උපකරණ | : | 20% |
| මෝටර් වාහන | : | 25 % |

(4) 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කාල සීමාව වෙනුවෙන් රු.300,000/- ක රක්ෂණ වාරිකය ගෙවා තිබුණි.

(5) 2019 මාර්තු මාසය සඳහා ගෙවිය යුතු විදුලිය රු.148,000/- ක් වූ අතර, එය ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

(6) 2019 මාර්තු 31 දිනට පැවති වෙළෙඳ ලැබිය යුතු මුදල්වලින් අඩමාන ණය සඳහා 10% ක පොදු ප්‍රතිපාදනයක් කිරීමට **මහීල්** තීරණය කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2019 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |